# පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2010

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.2.1 <u>ගණකාධිකරණ අඩුපාඩු</u>

ප්‍රාග්ධන අත්තිකාරම් වශයෙන් ගෙවන ලද පියවා නොතිබූ රු.207,241 ක මුදලින් වැය නොවූ කොටස වැය නොවූ මූලධන වියදම් ලෙස ගිණුම් ගත විය යුතු වුවත් සම්පූර්ණ අත්තිකාරම් මුදලම වැය වූ මූලධන වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

#### 1.2.2 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) "වෙනත් ලැබියයුතු ගිණුමෙහ" රු. 123,088 ක ශේෂයක් වර්ෂ 06 කට වැඩි කාලයක් ගතවී ඇතත් නිරවුල් කර නොතිබුණි.

(ආ) වෙනත් බැරකම් යටතේ අවලංගුකල චෙක්පත් ලෙස දක්වා ඇති ශේෂය තුල රු. 16,815 ක චෙක්පත් අවලංගු කර වසර 05 කට වැඩි කාලයක් ගතවී ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රු.214,022 ක් වූ ප්‍රාග්ධන අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිරවුල් කර නොතිබූ අතර එම අත්තිකාරම් තුල රු. 6,713 ක වසර 03 කට වඩා පැරණි අත්තිකාරම් ශේෂයක්ද විය.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 09 ක් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

### 1.2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මු .රෙ. 396 | නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල මාස 06 ඉකුත් වූ එකතුව රු. 13,088 ක් වූ චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් අදාල පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) අංක 09 හා 2006 මාර්තු 01 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 04 වන පරිච්ජේදය | ප්‍රවාහන,ආරක්ෂක,පවිත්‍රතා හා වෙනත් ගිවිසුම් ගත සේවා වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී පිළිවෙලින් රු.737,869 ක් , රු.639,078 ක් , රු. 279,666 ක් හා රු. 33,398 ක් වැය කර තිබුණද එම සේවා ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. |

### 1.2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 1994 ජුනි 14 දින හා අංක 95 දරන චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා භාෂා ප්‍රවීනතා දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු. 56,440 ක් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනිමට පෙර රු.30,801,301 ක ඌනතාවයක් වු අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.29,360,818 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.33,639,960 ක් වූ ප්‍රදානය හේතුකොටගෙන සමාලෝචිත වර්ෂය සඳහා රු.2,838,659 ක අතිරික්තයක් ඇති වී තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 28,636,000 ක ප්‍රදානය හේතු කොට ගෙන එම වර්ෂය සඳහා ඌනතාවය රු. 724,818 කට අඩු වී තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 අධ්‍යයන කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා 03 ක්ද ශාස්ත්‍රපති පාඨමාලා දෙකක්ද විද්‍යාපති, දර්ශනපති හා දර්ශන විශාරද පාඨමාලා එක බැගින් ද පැවැත්වීමට සැලසුම් කර තිබුණි.ඒ අනුව පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා 03 ක් සඳහා ශිෂ්‍යයින් 56 දෙනෙක් ද විද්‍යාපති පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් 47 දෙනෙක්ද දර්ශනපති හා දර්ශන විශාරද පාඨමාලා 02 ක් සඳහා පිළිවෙලින් ශිෂ්‍යයින් 03 දෙනෙකු හා 06 දෙනෙකු ද ලයාපදිංචි වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ පැවැත්වූ ශාස්ත්‍රපති (පුරාවිද්‍යා) හා ශාස්ත්‍රපති (උරුම අධ්‍යයන) පාඨමාලා සඳහා සමාලෝචිත වර්ෂයේදී ශිෂ්‍යයින් ලියාපදිංචි වී නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයේදී පවත්වන ලද විද්‍යාපති, ශාස්ත්‍රපති, කෞතුකාගාර විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා උරුම අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා වල අධ්‍යයන ප්‍රතිඵල මෙතෙක් නිකුත් කර නොතිබුණි.

#### 2.2.2 කාර්ය මණ්ඩලය

කාර්ය මණ්ඩලයේ සෑම නිලධාරියෙකු හා සේවකයෙකු වෙනුවෙන්ම රාජකාරි පැවරීමක් සිදු කල යුතු වුවත් 32 ක් වූ ආයතනයේ මුළු කාර්ය මණ්ඩලයෙන් 08 දෙනෙකු වෙනවෙන් රාජකාරි පැවරීම් කර නොතිබුණි.

### 2.2.3 පෞද්ගලික ආරක්ෂක සේවය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවා ගිවිසුම අනුව වයස අවු .60 ඉක්මවූ සේවකයන් ආරක්ෂක සේවයේ නොයෙදිය යුතු වුවද අවු .60 ඉක්මවූ සේවකයකු ආරක්ෂක සේවයේ යොදවා තිබුණි.

(ආ) ආයතන පරිශ්‍රයේ පිහිටීම,භූමි ප්‍රමාණය හා අවශ්‍යතාවය නොසලකා දෛනික පැය අටේ සේවා මුර තුන සඳහාම ආරක්ෂක සේවකයින් තිදෙනෙකු බැගින් යොදවා ගෙන තිබූ අතර රාත්‍රී වැඩ මුර, ආයතනයේ නිලධාරියකුගේ අධීක්ෂණයට ලක් වී නොතිබුණි.

### 2.2.4 තොග පාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික තොග සමීක්ෂණය අනුව පුස්තකාල පොත් 164 ක හා සඟරා 139 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

(ආ) තොග ගැලපුම් ගිණුමෙහි රු. 41,505 ක ශේෂය වර්ෂ 03 කට වැඩිකාලයක් ගතවී ඇතත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) මුද්‍රණය කර වර්ෂ 10 කට වඩා පැරණි අගය රු. 250,508 ක චලනය නොවන තොගයක් ප්‍රකාශන තුල විය.

### 2.2.5. කොන්ත්‍රාත් පරිපාලනය

පුස්තකාල හා දේශන ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පිළියෙල කරන ලද රු.මි. 36 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තුව 2005 අගෝස්තු 03 දින කැබිනට් මණ්ඩලය අනුමත කර තිබූ අතර වැට් රහිත රු. 33,804,507 ක ලංසුවකට 2007 ජනවාරි 19 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව 2007 නොවැම්බර් 27 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණද මාස 18 ක කාලයක් තුලදී හතර වතාවක් කාලය දීර්ඝ කිරීම නිසා කාලය වෙනස්වීම හා මිල විචලනය මත ඇස්තමේන්තුවට වඩා රු. 4,743,414 කින් පිරිවැය ඉහළ ගොස් තිබුණි.

මෙම ගොඩනැගිල්ල ගස්කොළන් නොමැති භූමියක ඉදිකිරීමට පලමුව සැලසුම් කර තිබුණද පසුව ගස්කොළන් මැදිකොට□ඉදිකිරීම නිසා ගස්වල මුල් හා අතුවල බලපෑම් ඇතිවීමෙන් ගොඩනැගිල්ලේ ඉරිතැලීම් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. තවද මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ අඩුපාඩු කොන්ත්‍රාත්කරු සම්පූර්ණ කර නොතිබූ අතර එම අඩුපාඩු වෙනුවෙන් රු. 82,141 ක් බිල්පත් වලින් අඩුකර ගෙන ගෙවීම් කර තිබුණද ගොඩනැගිල්ලෙහි අඩුපාඩු මෙතෙක් සම්පූර්ණ කර නොතිබුණි.

2.2.6. **අරමුදල් ඌන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන සහ පුනරාවර්තන කටයුතු සඳහා පවත්වාගෙන යන ලබන බැංකු ජංගම ගිණුම් දෙකෙහි සමාලෝචිත වර්ෂය තුල මාසය අවසානයේ අවම තැන්පතු පිළිවෙලින් රු. 2,808,106 ක් සහ රු. 4,019,133 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුල එම ගිණුම් වල තැන්පතු වල සාමාන්‍යය පිළිවෙලින් රු. 5,376,703 ක් හා රු. 5,946,359 ක් වූ බැවින් අරමුදල් උපයෝජනය නොකර ජංගම ගිණුම් වල රඳවා තිබීම නිසා එම මුදල් ආයෝජනය කිරීමෙන් ලබා ගැනීමට තිබූ ප්‍රතිලාභ අහිමිවී තිබුණි.

(ආ) රු. 153,508 ක මුදලක් බැංකු ජංගම ගිණුම් තුනක වසර 05 කට වැඩි කාලයක් රඳවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය ආරම්භ වන විට රු. 3,191,598 ක ශේෂයක් වැය නොවූ මූලධන ගිණුමේ තිබියදී වර්ෂය තුල රු. 400,000 ක ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණි.එසේ වුවද වැයකර තිබුණ මුදල රු. 890,592 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 2,701,006 ක් එනම් ප්‍රතිපාදනයෙන් 75% ක් ඉතිරිවී තිබුණි.

2.2.7 **අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත හා තථ්‍ය ආදායම් වියදම් අතර සැලකිය යුතු විචලනයන් වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

3. **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින්වර යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) පුස්තකාල පරිපාලනය

(ආ) ව්‍යාපෘති

(ඇ) කාර්ය මණ්ඩල

(ඈ) ගබඩා පාලනය